**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරුවලට පත් කිරීම - 2024</u>**

පහත තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

| **තනතුර** | **පුරප්පාඩු ගණන** |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ | 15 |
| ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් | 04 |
| **මුළු පුරප්පාඩු ගණන** | **19** |

## 1. සුදුසුකම්

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

II. ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියට උසස්වීමෙන් පසු කාලය තුළ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම.

## 2. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය

I. මේ සමඟ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, **2024. 03.15** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කොට තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඔබගේ මෑතකදී ලබා ගන්නා ලද අඟල් 2x2$^1/_2$ වර්ණ ඡායාරූපයක් අයදුම්පතේ දකුණු පස ඉහළ කෙළවරෙහි අලවා එවිය යුතු වේ.

## 3. ක්‍රමවේදය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති අනුව, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලබාදෙනු ලබන ලකුණු මත 2024.06.30 දින දක්වා පුරප්පාඩු වන තනතුරුවලට නිලධාරීන් පත් කිරීම සේවා අවශ්‍යතාවය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය පරිදි අධ්‍යාපන ලේකම්ගේ අභිමතය අනුව සිදු කරනු ලැබේ. තවද, අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරුවලට තෝරා පත් කර ගන්නා ලද නිලධාරීන් ස්ථාන ගත කිරීමේදී ඇමුණුම 01 හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම්, සේවා පළපුරුද්ද පිළිබඳ සැලකිල්ලට ගෙන එහි සඳහන් කර ඇති සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කරනු ලැබේ.

4. අදාළ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. මෙම තනතුරු වලට පත්කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

5. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරනු ලබන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

වසන්තා පෙරේරා
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

2024.02.22

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් අධ්‍යාපන අධ්‍යක්ෂ / කොමසාරිස් තනතුරු වලට පත් කිරීම සඳහා පවතින හා ඉදිරියේදී පුරප්පාඩු වන තනතුරු - 2024**

## 1. අධ්‍යාපන අමාත්‍යාංශය

| අනු අංකය | තනතුර | පුරප්පාඩු වන / වීමට නියමිත දිනය |
|---|---|---|
| 01 | අධ්‍යාපන අධ්‍යක්ෂ (මුස්ලිම් පාසල් සංවර්ධන) | 2021.10.21 |
| 02 | අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) | 2022.12.31 |
| 03 | අධ්‍යාපන අධ්‍යක්ෂ (විෂය සමගාමී, මාර්ගෝපදේශන හා උපදේශන) | 2023.01.16 |
| 04 | අධ්‍යාපන අධ්‍යක්ෂ (ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන) | 2023.05.17 |
| 05 | අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සැලසුම් හා ධාරිතා සංවර්ධන) | 2023.05.17 |
| 06 | අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන) | 2023.09.19 |
| 07 | අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය අධ්‍යාපන) | 2023.09.19 |
| 08 | අධ්‍යාපන අධ්‍යක්ෂ (වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන) | 2023.10.13 |
| 09 | අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු) | 2024.01.05 |
| 10 | අධ්‍යාපන අධ්‍යක්ෂ (විදේශ ආයතන හා විදේශ කටයුතු) | 2024.01.12 |
| 11 | අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ) | 2024.03.08 |
| 12 | අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන සංවර්ධන) | 2024.02.12 |
| 13 | අධ්‍යාපන අධ්‍යක්ෂ (වතු පාසල් සංවර්ධන) | 2024.02.12 |
| 14 | අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) | 2024.01.08 |
| 15 | අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර) | ශ්‍රී ලං.අ.ප.සේ. විශේෂ ශ්‍රේණියට උසස්වීම මත පුරප්පාඩුවීමට නියමිතව ඇත. |

## 2. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| අනු අංකය | තනතුර | පුරප්පාඩු වන / වීමට නියමිත දිනය |
|---|---|---|
| 01 | විභාග කොමසාරිස් (ආයතනික විභාග) | 2023.04.17 |
| 02 | විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන) | 2024.02.12 |
| 03 | විභාග කොමසාරිස් (පාලන හා විමර්ශණ) | 2024.02.12 |
| 04 | විභාග කොමසාරිස් (තාක්ෂණ) | 2024.02.12 |

# අධ්‍යාපන අමාත්‍යාංශයේ හා ඒ යටතේ ආයතනවලට අනුමත ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු

සාමාන්‍ය සේවක සංඛ්‍යාව

| | | |
|---|---|---|
| 1 | අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු) | පාසල් පරිපාලනයේ අවම වශයෙන් වසර 02 සේවා පළපුරුද්දක් තිබීම, චක්‍රලේඛ, පනත්, රෙගුලාසි පිළිබඳ අවබෝධය |
| 2 | අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන සංවර්ධන) | විදුහල්පතිවරයෙකු ලෙස වසර දෙකකට වැඩි සේවා පළපුරුද්ද, පාසල් පරිපාලන, අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය පිළිබඳව ඇති සේවා පළපුරුද්ද |
| 3 | අධ්‍යාපන අධ්‍යක්ෂ (විදේශ ආයතන හා විදේශ කටයුතු) | සිංහල / ඉංග්‍රීසි / වෙනත් භාෂාවන් පිළිබඳ දැනුම, ජාත්‍යන්තර සබඳතා පිළිබඳව ලබා ඇති සහතික හා එම කටයුතු පිළිබඳ අවබෝධය, වීසා කටයුතු, ගුවන් ටිකට්පත් ලබා ගැනීමේ ආදී කටයුතු පළපුරුද්ද |
| 4 | අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ) | විදුහල්පතිවරයෙකු ලෙස වසර තුනක සේවා පළපුරුද්ද, පරිපාලනය හා පාසල් කළමනාකරණය පිළිබඳ දැනුම |
| 5 | අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සැලසුම් හා ධාරිතා සංවර්ධන) | විදුහල්පතිවරයෙකු ලෙස ලබා ඇති දැනුම, පාසල් කළමනාකරණය හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ලබා ඇති පරිචය |
| 6 | අධ්‍යාපන අධ්‍යක්ෂ (විෂය සමගාමී, මාර්ගෝපදේශන හා උපදේශන) | පාසල් පරිපාලනයේ අවම වශයෙන් වසර 03 සේවා පළපුරුද්දක් තිබීම, උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව, පාසල් මාර්ගෝපදේශනය, උපදේශනය පිළිබඳව සේවා පළපුරුද්ද |

විශේෂ සේවක සංඛ්‍යාව

| | | |
|---|---|---|
| 1 | අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන) | විෂයට අදාළ පූර්ව සේවා පළපුරුද්ද (ගුරුවරයෙකු හෝ සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස) හා අධ්‍යාපන සුදුසුකම් (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයට අදාළව), සේවා ඇගයීම් ලබා තිබීම |
| 2 | අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා) | තනතුරට අදාළ පූර්ව සේවා පළපුරුද්ද (ගුරුවරයෙකු හෝ සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස), අධ්‍යාපන සුදුසුකම් (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා විෂය ක්ෂේත්‍රයට අදාළව), සේවා ඇගයීම් ලබා තිබීම, ජාතික මට්ටමින් වර්ණ ලබා තිබීම, ජාතික ශිෂ්‍යභට බලකායේ හෝ යුධ හමුදා අධිකාරිය ලත් නිලයක මේජර් හෝ ඊට ඉහළ නිලයක් දරණ අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| 3 | අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය අධ්‍යාපන) | විෂයට අදාළ පූර්ව සේවා පළපුරුද්ද (ගුරුවරයෙකු හෝ සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස) හා අධ්‍යාපන සුදුසුකම් (සෞන්දර්ය අධ්‍යාපන විෂය ක්ෂේත්‍රයට අදාළව), සේවා ඇගයීම් ලබා තිබීම |
| 4 | අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර) | මව් භාෂාවට අමතරව තවත් භාෂාවකින් වැඩ කිරීමේ ජාතික / පළාත් මට්ටමේ පළපුරුද්ද තහවුරු කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / පළාත් අධ්‍යාපන ලේකම් විසින් තහවුරු කළ සහතික / ලිපි |
| 5 | අධ්‍යාපන අධ්‍යක්ෂ (වතු පාසල් සංවර්ධන) | සිංහල / දෙමළ භාෂාව ලිඛිත / වාචිකව හැසිරවීමේ නිපුණතාවය |
| | | අදාළ පාසල්වල අධ්‍යාපන කටයුතු / පසුබිම / සංස්කෘතිය පිළිබඳ මනා අවබෝධයක් තිබීම |
| | | දෙමළ මාධ්‍ය පාසලක විදුහල්පතිවරයෙකු ලෙසට වසර තුනකට වඩා වැඩි සේවා පළපුරුද්ද |
| | | අදාළ ජන වර්ගයට අයත් නිලධාරීන් කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| 6 | අධ්‍යාපන අධ්‍යක්ෂ (මුස්ලිම් පාසල් සංවර්ධන) | සිංහල / දෙමළ භාෂාව ලිඛිත / වාචිකව හැසිරවීමේ නිපුණතාවය |
| | | අදාළ පාසල්වල අධ්‍යාපන කටයුතු / පසුබිම / සංස්කෘතිය පිළිබඳ මනා අවබෝධයක් තිබීම |
| | | මුස්ලිම් පාසලක විදුහල්පතිවරයෙකු ලෙස වසර තුනකට වඩා වැඩි සේවා පළපුරුද්දක් ලබා තිබීම |
| | | අදාළ ජන වර්ගයට අයත් නිලධාරීන් කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කරනු ලැබේ. |
| 7 | අධ්‍යාපන අධ්‍යක්ෂ (වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන) | විෂයට අදාළ පූර්ව සේවා පළපුරුද්ද (ගුරුවරයෙකු හෝ සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස) හා අධ්‍යාපන සුදුසුකම් (වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන විෂය ක්ෂේත්‍රයට අදාළව), සේවා ඇගයීම් ලබා තිබීම |
| 8 | අධ්‍යාපන අධ්‍යක්ෂ (ඩිජිටල් අධ්‍යාපන යටිතල පහසුකම් සංවර්ධන) | විෂයට අදාළ පූර්ව සේවා පළපුරුද්ද (ගුරුවරයෙකු හෝ සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස) හා අධ්‍යාපන සුදුසුකම් (තොරතුරු තාක්ෂණ විෂය ක්ෂේත්‍රයට අදාළව), සේවා ඇගයීම් ලබා තිබීම |
| 9 | අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) | පිරිවෙන් ගණය යටතේ පත්වීම් ලබා තිබීම හෝ පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳව පවතින දැනුම, බුද්ධ ධර්මය, බෞද්ධ සංස්කෘතිය, පාලි, සිංහල භාෂා වලින් ලබා ගත් උපාධිය, පශ්චාත් උපාධිය |

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් තනතුරු

| | | |
|---|---|---|
| 1 | විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන) | අධ්‍යාපනික මිනුම, තක්සේරුකරණය, ඇගයීම ප්‍රධාන විෂය ධාරාව කරගත් ඩිප්ලෝමාව හෝ මූලික උපාධිය හෝ පශ්චාත් උපාධිය |
| | | ජාතික මට්ටමේ අධ්‍යාපනික තක්සේරුකරණය විශ්ලේෂණය සහ වාර්තාකරණය සම්බන්ධයෙන් අවම වසර 03ක පළපුරුද්ද |
| | | දත්ත විශ්ලේෂණය සඳහා වන R, SPSS, SAS වැනි පරිගණක යෙදවුම් භාවිතය, ඒ හා සම්බන්ධ වන දත්ත ගබඩාකරණය සහ ගවේෂණය, වාර්තාකරණය සම්බන්ධයෙන් වන නූතන පරිගණක හා තොරතුරු තාක්ෂණික යෙදවුම් භාවිතය පිළිබඳ මනා අවබෝධය |
| | | මනෝමිතික මූලධර්ම, තක්සේරුකරණ සැලසුම් සහ සංඛ්‍යානමිතික විශ්ලේෂණ ශිල්පීය ක්‍රම පිළිබඳ මනා දැනුම |
| | | තොරතුරු තාක්ෂණය / සංඛ්‍යානය ප්‍රධාන විෂය ධාරාව කරගත් මූලික උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| 2 | විභාග කොමසාරිස් (තාක්ෂණ) | පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයක් ප්‍රධාන විෂය ධාරාව කරගත් මූලික උපාධියක් හෝ පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| | | තොරතුරු තාක්ෂණ කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වසර 03ක පළපුරුද්ද |
| | | සංඛ්‍යානය ප්‍රධාන විෂය ධාරාව කරගත් මූලික උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපනික මිනුම්, තක්සේරුකරණය, ඇගයීමට අදාළ උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| | | විභාග කළමනාකරණ පද්ධතිය, මාර්ගගත තක්සේරුකරණය, දත්ත විශ්ලේෂණය ඇතුළු තොරතුරු තාක්ෂණ පද්ධති සහ යටිතල පහසුකම් පිළිබඳ මනා අවබෝධය |
| 3 | විභාග කොමසාරිස් (ආයතනික විභාග) | තක්සේරුකරණය හෝ මනෝමිතික විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයන් ප්‍රධාන විෂය ධාරාව කරගත් මූලික උපාධිය හෝ පශ්චාත් උපාධිය ලබා තිබීම. එසේ නොවන අවස්ථාවක, පිළිගත් ආයතනයකින් ලබා ගත් ඒ හා සමාන මට්ටමේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් |
| | | පරීක්ෂණ සංවර්ධනය සහ නියාමනය සම්බන්ධයෙන් අවම වසර 03ක පළපුරුද්ද |
| | | විවිධ රැකියා භූමිකාවන් සඳහා අවශ්‍ය ප්‍රධාන නිපුණතා සහ කුසලතා හඳුනා ගැනීම සහ ඒ සඳහා වලංගු සහ විශ්වාසයතාවෙන් යුතු තක්සේරුකරණ ක්‍රමවේද සේවා යෝජකයන් සහ විෂය කරුණු ප්‍රවීණයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් හඳුනා ගැනීම සහ කාර්ය සංවිධානය පිළිබඳ දැනුම |
| | | තොරතුරු තාක්ෂණය / සංඛ්‍යානය සම්බන්ධ මූලික උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් උපාධියක් ලබා තිබීම |
| 4 | විභාග කොමසාරිස් (පාලන හා විමර්ශන) | පරිපාලන කාර්යයන් සම්බන්ධයෙන් දැනුම හා අවම වසර 03ක පළපුරුද්ද |
| | | පරිපාලන මූලධර්ම, ක්‍රියා පටිපාටි, ප්‍රශස්ත භාවිතයන් හා විමර්ශන කාර්යයන් පිළිබඳව මනා දැනුම හා පළපුරුද්ද |
| | | අධ්‍යාපනික මිනුම්, තක්සේරුකරණය, ඇගයීමට අදාළ මූලික උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් උපාධියක් හෝ පිළිගත් ආයතනයකින් ලබා දෙන ලද හා සමාන මට්ටමේ අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම |